# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2335/10 – 2023 ජුනි මස 06 වැනි අඟහරුවාදා – 2023.06.06**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2020/80.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2022.01.08 දිනැති හා අංක 2261/96 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2021.12.31 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 03, කොල්ලුපිටිය, පෙරහැර මාවත, අංක ඒ/1/39 හි පදිංචි ඩබ්. ජේ. එම්. ඩී. නවරත්න මහතා සහ කොළඹ 07, විද්‍යා මාවත, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හි පිහිටි ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.05.11 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 මැයි මස 26 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 039635 – 18 (2023/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කොළඹ බේරුම්කරණ අංශය සහ කාර්මික අධිකරණයේ දී ය**

බේරුම්කරු - නීතිඥ ආචාර්ය කාංචන සිල්වා මැතිතුමා ඉදිරිපිට දී ය.

ඩබ්. ජේ. එම්. ඩී. නවරත්න,
අංක ඒ/1/39, පෙරහැර මාවත, කොල්ලුපිටිය,
කොළඹ 03.

*පළමුවැනි පාර්ශ්වය.*

*ගොනු අංකය*: IR/COM/04/2020/80
බේරුම්කර අංකය: A/01/2022.

ව්‍යසන කළමනාකරණය, සඳහා වූ ජාතික සභාව,
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය,
විද්‍යා මාවත, කොළඹ 07.

*දෙවැනි පාර්ශ්වය.*

අතර පවතින කාර්මික ආරාවුල

**ප්‍රදානය**

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

ඉහත අංක සඳහන් බේරුම්කරණ යොමුවට (Reference of Arbitration) අදාළ කාර්මික ආරාවුල පහත පරිදි වේ.

"ඩබ්. ජේ. එම්. ඩී. නවරත්න මහතා වෙත චෝදනා පත්‍රයක් නිකුත් කර වරදකරු කර 2017.02.09 දින සේවයෙන් පහකිරීම තුලින් ඒ මහතාට අසාධාරණයක් සිදුවී තිබේද? එසේ නම් හිමිවිය යුතු සහනයන් කවරේද? යන්න පිළිබඳව වේ."

**පෙනී සිටීම.**

පළමු පාර්ශ්වය සමග නීතිඥ ඉසුරු ලක්පුර මහතා පෙනී සිටී.

දෙවන පාර්ශ්වය වෙනුවෙන් සහකාර රජයේ අධිනීතිඥ දිලිනි පෙරේරා මහත්මිය, පරිපාලන නිලධාරි ඩබ්. එස්. වීරප්පෙරුම මහත්මිය, නීතිඥ අයෝධ්‍යා රූපසිංහ මහත්මිය, බී. ඒ. සී. ඒ. ජයරත්න මහතා, කළමනාකරණ සහකාර එස්. සෙල්වකාන්ති මහත්මිය පෙනී සිටී.

**<u>ප්‍රදානය:</u>**

**<u>පළමු පාර්ශ්වයේ ඉල්ලීම</u>**

පළමු පාර්ශ්වය විසින් දිගින් දිගටම ඉල්ලා සිටින ලද්දේ,

01. සියලු හිඟ වැටුප් සහිතව පළමු පාර්ශ්වය වර්තමාන වැටුප් තලයේ පිහිටුවා නැවත සේවයේ පිහිටුවීමට දෙවන පාර්ශ්වයට නියෝග කරන ලෙසත්,
02. ඉහත පරිදි නැවත සේවයේ නොපිහිටුවන්නේ නම් පළමු පාර්ශ්වයට සිදු වූ අගතිය සලකා බලා සාධාරණ සහ යුක්තිසහගත වන්දි මුදලක් ප්‍රදානය කරන ලෙසත්,
03. පළමු පාර්ශ්වයට හිමි සේවය තහනම් කර තිබූ කාලයට අදාළව වැටුප් ගෙවන ලෙස දෙවන පාර්ශ්වයට නියෝග කරන ලෙසත්,
04. මෙම බේරුම්කරණයට අදාළව නෛතික ගාස්තු පළමු පාර්ශ්වයට ගෙවන ලෙස දෙවන පාර්ශ්වයට නියෝග කරන ලෙසත්,
05. ගරු බේරුම්කරණ අධිකරණයට උචිත යැයි හැඟෙන වැඩිමනත් සහනයන් පළමු පාර්ශ්වයට ලබා දෙන ලෙසත්ය.

<u>දෙවන පාර්ශ්වයේ පිළිතුර වූයේ,</u>

01. මෙම නඩුව තුළ සජීවී කාර්මික ආරාවුලක් (Live Dispute)නොමැති බවත්,
02. මෙම නඩුව අසා තීරණය කිරීමට කාර්මික අධිකරණයට අධිකරණ බලයක් නොමැති බවත්,
03. එනයින් පළමු පාර්ශ්වයේ ඉල්ලීම විමසීමට ගැනීමකින් තොරව මුල් අවස්ථාවේදීම නිෂ්ප්‍රභා කරන ලෙසද, පළමු පාර්ශ්වයේ ඉල්ලුම්පත්‍රය නිෂ්ප්‍රභා කරන ලෙස ද, නඩු ගාස්තු හා අධිකරණයට මැනවැයි හැඟෙන වෙනත් හා වැඩිමනත් සහනයන් ලබා දෙන ලෙසත්ය.

<u>පසුබිම</u>

පළමු පාර්ශ්වය 2008.04.24 දින සහකාර අධ්‍යක්ෂවරයෙකු වශයෙන් ආපදා කලමනාකරණ මධ්‍යස්ථානයේ සේවයට බැඳුනු බවත් සේවය අවසන් කරන ලද දිනය දක්වාම එම තනතුරේ සේවය කළ බවත් දක්වා ඇත.

ඇමරිකා එක්සත් ජනපදයේ හවායි නුවර ආරක්ෂක අධ්‍යයනය පිළිබඳ ආසියානු පැසිෆික් මධ්‍යස්ථානය (Asia Pacific Center for Security Training) විසින් 2017.02.19 දින සිට 2017.03.15 දින දක්වා සංවිධානය කරන ලද සංයුක්ත අර්බුද කළමනාකරණය (Comprehensive Crisis Management Seminar) පිළිබඳ සම්මන්ත්‍රණයට සහභාගී වීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් පළමු පාර්ශ්වයට අවස්ථාව ලබා දී ඇත.

ඒ අනුව 2017.02.07 වන දින පළමු පාර්ශ්වය ඇමරිකා එක්සත් ජනපදය වෙත පිටත් වී ඇති අතර නොවාටා අංක 444 හි පිහිටි ස්ථානයේ නවාතැන් සපයා තිබූ බවත් එහිදී යම් පුද්ගලයකු හෝ ආයතනයක් විසින් සිදු කරන ලද පැමිණිල්ලක් ප්‍රකාරව පළමු පාර්ශ්වය පොලිස් අත්අඩංගුවට පත්වූ බවත්,

එකී අත්අඩංගුවට ගැනීමෙන් අනතුරුව 2017.02.15 දිනැති අංක 007-17-CE දරන ඇමරිකානු තානාපති කාර්යාලය විසින් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙත දන්වා ඇති පරිදි පළමු පාර්ශ්වය හට නවාතැන් පහසුකම් සපයා ඇති ස්ථානයේදී 2017 පෙබරවාරි 09 දින එම ස්ථානයේ සේවය කළ සේවිකාවට ලිංගික අඩත්තේට්ටමක් සිදු කිරීම යන චෝදනාව මත පළමු පාර්ශ්වය හොනලුලු පොලිසිය මගින් අත්අඩංගුවට ගෙන ඇති බවත් පසුව එම වරද සුළු අඩත්තේට්ටමක් දක්වා පහත දමා ඇති බවත් එම චෝදනාව හේතුවෙන් පළමු පාර්ශ්වයට පුහුණු සැසිය සඳහා සහභාගී වීමට ඉඩ ලබා දී නොමැති බවත් අවධාරණය කර ඇත.

ඒ අනුව දෙවන පාර්ශ්වය විසින් ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ රාජ්‍ය නිලධාරීන් විසින් සිදු කළ හැකි වැරදි සම්බන්ධව පළමුවන උපලේඛනයේ අංක (2) හා (10) සම්බන්ධ වැරදි සිදුකර ඇති බවට පෙනී ගොස් ඇති හෙයින් එම පරිච්ඡේදයේ 31:1 වගන්තිය අනුව කටයුතු කරමින් පළමු පාර්ශ්වයට 2017.02.17 දින සිට වැඩ තහනමකට ලක් කරන ලද බවත් ඉන් අනතුරුව දෙවන පාර්ශ්වය විසින් මූලික පරීක්ෂණයක් පැවැත් වූ බවත්,

මූලික විමර්ශනයෙන් අනතුරුව පළමු පාර්ශ්වයට එරෙහිව චෝදනා 13 කින් සමන්විත චෝදනා පත්‍රයක් නිකුත් කරන ලද බවත් ඒ මත පදනම්ව විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා ඇති බවත් චෝදනා පත්‍රයේ සඳහන් චෝදනා අතරින් 01 සහ 02 චෝදනා හැරුණු කොට අනෙකුත් සෑම චෝදනාවකටම පළමු පාර්ශ්වය වරදකරු ලෙසට තීරණය කර ඇති බවත්,

එම විධිමත් විනය පරීක්ෂණයේ නිර්දේශ අනුව දෙවන පාර්ශ්වය විසින් පළමු පාර්ශ්වය 2018.11.23 දිනැති ලිපිය මගින් 2017.02.09 වන දින සිට සේවයෙන් ඉවත් කිරීම සිදු කළ බවත්ය.

දෙවන පාර්ශ්වය විසින් වෙසෙසින් අවධාරණය කර ඇති කරුණ නම්, මෙම නඩුව තුළ සජීවී ආරාවුලක් (Live Dispute) නොමැති වීම මෙම නඩුව අසා තීරණය කිරීමට කාර්මික අධිකරණයට බලයක් නොමැති බවය.

කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය සහ 48 අර්ථ නිරූපණ වගන්තිය සමග කියවීමේදී එය ඕනෑම කාර්මික ආරාවුලක් සම්බන්ධයෙන් අනුකූල බව පැහැදිළි වේ. තවද කාර්මික ආරාවුල් පනතේ සේවකයා යන අර්ථ නිරූපණය තුළට තත් කාලයේ සේවයේ යෙදී සිටින්නකු මෙන්ම සේවය අවසන් කළ තැනැත්තකු ද අදාල බව පැහැදිලිය. එසේම කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය මගින් සුළු ආරාවුලක් බේරුම්කරණය වෙත යොමු කිරීමට අමාත්‍යවරයාට ඇති බලතල පරිපාලනමය බලයක් බව පැහැදිලිය. එකී බලය යුක්තිය, සාධාරණත්වය හා කාර්මික සාමය ප්‍රශස්ථ ලෙස පවත්වා ගැනීම උදෙසා යෙදවිය යුතු බව මෙම ගරු අධිකරණයේ මතයයි. එනයින් ප්‍රතිඵල විය හැකි අනර්ථයක් වැළැක්වීමට තත් බලය භාවිත කිරීම අනුචිත යැයි නොසැලකුව මනාය.

The Estate and Agency Co Ltd V.Perera 78 NLR 289 නඩුවේදී ඉල්ලුම්කරුගේ සේවය අවසන් කිරීමේදී බේරුම්කරණ අධිකරණය වෙත යොමු කිරීමට අමාත්‍යවරයාට ඇති බලය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පිළිගෙන ඇත.

එනයින් දෙවන පාර්ශ්වයේ මූලික විරෝධතාවය ප්‍රකාරව මෙම නඩුව හා සබැඳිව සජීවී ආරවුලක් නොමැති බවට හා/හෝ මෙම නඩුව අසා තීරණය කිරීමට කාර්මික අධිකරණයට බලයක් නොමැති බවට දක්වා ඇති තර්කය ගරු අධිකරණය විසින් ප්‍රතික්ෂේප කරනු ලබයි.

ප්‍රස්තුත නඩුකරයට මූලිකව බලපෑ ඇති සිද්ධිමය කරුණ සම්බන්ධයෙන් වන විට හවායිහි හොනලුලු ගරු අධිකරණයේ ගොනු කරන ලද නඩුකරයේ චෝදනා වල පදනම වශයෙන් අඩත්තේට්ටම් කිරීම harassment යනුවෙන් සඳහන්ව ඇති බව දැක්වේ. තත් කරුණ සම්බන්ධයෙන් ඇමරිකානු තානාපති කාර්යාලය විසින් ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිඛිතව දන්වා ඇත්තේ මුලදී අදාළ චෝදනාව ලිංගික අඩත්තේට්ටම් කිරීමක් (Sexual assault) ලෙස දක්වා තිබුනද පසුව එය සාමාන්‍ය පහරදීමක් (Simple assault) ලෙස සංශෝධනය කර ඇති බවය. එසේම හොනලුලු අධිකරණය විසින් සිදු කරන ලද කරුණු විමසීමේදී පළමු පාර්ශ්වය එකී චෝදනාවන්ට තමන් නිවැරදිකරු ලෙස ප්‍රකාශ කර ඇත.

පළමු පාර්ශ්වයට එරෙහිව පවත්වන ලද මූලික විමර්ශනයේදී මූලික විමර්ශන නිලධාරි විසින් අවධාරණය කරන ලද මතු සඳහන් කරුණු කෙරෙහි දෙවන පාර්ශ්වය නිසි අවධානයක් යොමු කර නොමැති බව ප්‍රකට වේ.

01. අදාළ සිද්ධිය සම්බන්ධයෙන් ප්‍රමාණවත් සාක්ෂි නොමැති හෙයින් ඒ සම්බන්ධයෙන් ඇමරිකාවේ ශ්‍රී ලංකා තානාපතිවරයාගෙන් පූර්ණ වාර්තාවක් ගෙන්වා ගැනීම,

02. තත් අධිකරණයට ඉදිරිපත් කර ඇති පැමිණිල්ලේ Sexual assault යනුවෙන් චෝදනාවක් නොමැති බවත් ඒ වෙනුවට ඇත්තේ harassment සම්බන්ධයෙන් වන චෝදනාවක් පමණක් බවත්,

03. අදාළ උසාවියේ නියෝගය ලැබෙන තෙක් පළමු පාර්ශ්වයට විරුද්ධව චෝදනා පත්‍රයක් නිකුත් කිරීම තාවකාලිකව අත්හිටුවීම යෝග්‍ය බවත්ය.

කෙසේ නමුත් උක්ත කරුණ සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වය නිසි අවධානයක් යොමු කර ඇති බවක් ප්‍රකට නොවේ.

තවද අනතුරුව සිදු කරන ලද විධිමත් විනය පරීක්ෂණය සම්බන්ධයෙන් සලකා බලන කල තහවුරු කරන ලද වරදක් පාදක වූ බවක් පැහැදිළි නොවේ. පළමු පාර්ශ්වය අවධාරණය කරන පරිදි අදාළ පැමිණිලිකාරිය හෝ පැමිණිලිකරුගේ ප්‍රකාශයක් වෙනයම් ලිඛිත සාක්ෂියක්, ඇසින් දුටු සාක්ෂියක් හෝ අදාළ අධිකරණයේ නඩු තීන්දුවක් හෝ ඉදිරිපත් කර නොමැති බව පෙනී යයි.

මෙනයින් වෙසෙසින් අවධාරිත කරුණ නම්, නිර්දෝෂීභාවයේ පූර්ව නිගමනය දෙවන පාර්ශ්වය විසින් නොසලකා හැර ඇති බවයි.

යථෝක්ත කරුණ සමස්ථයක් ලෙස සලකා බලන කල පළමු පාර්ශ්වයේ නිර්දෝෂීභාවය පිළිබඳ පූර්ව නිගමනය ඛණ්ඩනය කිරීමට ප්‍රාමාණික කිසිදු සාධනීය සාක්ෂියක් දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කර නොමැති බව නිරීක්ෂණය කරමි.

තත් කරුණු සියල්ල සලකා බැලීමේදී පළමු පාර්ශ්වයට එරෙහිව පනවා ඇති විනය දඬුවම් සාධාරණ හා යුක්තිසහගත නොවන බවට තීරණය කරමි. එනයින් අදාළ ප්‍රස්තුත නඩුකරයට අදාළව පළමු පාර්ශ්වයට අසාධාරණයක් සිදු වී ඇති බවට තීරණය කරමි.

එසේ අසාධාරණයක් සිදුව ඇත්නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්නට මතු සඳහන් පරිදි පිළිතුරු සපයමි:

01. පළමු පාර්ශ්වය වර්තමාන වැටුප් තලයේ පිහිටුවා නැවත සේවයේ පිහිටුවීමට දෙවන පාර්ශ්වයට නියෝග කරමි,

02. පළමු පාර්ශ්වයට හිමි සේවය තහනම් කර තිබූ කාලයට අදාළ වැටුප් පළමු පාර්ශ්වය වෙත ගෙවීමට දෙවන පාර්ශ්වයට නියෝග කරමි.

අදාළ හිඟ වැටුප ලෙස රු.51844.00 x මාස 72 = රු 3,732,768.00 (තිස් හත් ලක්ෂ තිස් දෙදහස් හත්සිය හැට අට) ක මුදල මෙම නඩුවේ පළමු පාර්ශ්වය වෙත ලබා ගත හැකි වන පරිදි නියෝගය *ගැසට්ගත* කළ දිනයේ සිට දින 14 ක් ඇතුළත මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතු බවට මෙයින් නියෝග කරමි.

ලබාදී ඇති අනෙකුත් සහනයන් මෙම ප්‍රදානය *ගැසට්ගත* කරන දිනයේ සිට මාසයක් ඇතුළත ක්‍රියාත්මක කර ඒ බව මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත ලිඛිතව දැන්විය යුතු බවට මෙයින් නියෝග කරමි.

තවද පළමු පාර්ශ්වයට හිමි සේවක අර්ථසාධක හා අනෙකුත් සියළු දීමනා සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස්වරයා වෙත ඉල්ලුම් කිරීමට මෙම ප්‍රදානය කිසිඳු බාධාවක් ලෙස නොසැලකිය යුතුය.

මෙම තීරණය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බවද සටහන් කරමි.

නීතිඥ ආචාර්ය කාංචන සිල්වා
(බේරුම්කරු)

2023/05/11

EOG 06 - 0022

---

මාගේ අංකය : IR/Com/01/2018/241.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.11.09 දිනැති හා අංක 2148/59 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.11.04 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් එල්ලක්කල, වලලියද්ද, අංක 80/7 හී පදිංචි ඩබ්. ඒ. ඒ. ඩී. පුෂ්පකුමාර මයා සහ කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල හි පිහිටි එයාර්පෝර්ට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.04.28 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 මැයි මස 26 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**කොළඹ කාර්මික බේරුම්කරණ විනිශ්චය සභාව**

බේරුම්කරුඃ- කේ. කේ. කේ. ධනපාල මැතිණිය ඉදිරියේදී ය.

ඩබ්. ඒ. ඒ. ඩී. පුෂ්පකුමාර,
අංක. 80/7,
වලලියද්ද,
එල්ලක්කල.

*(පළමු පාර්ශ්වය)*

යොමු අංකය: IR/COM/01/2018/241.
නඩු අංකය: A/121/2019.

*සහ*

එයාර්පෝට් ඇන්ඩ් ඒවියේෂන්,
සර්විසස් (ශ්‍රී ලංකා) ලිමිටඩ්,
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල,
කටුනායක.

*(දෙවන පාර්ශ්වය)*

අතර පවත්නා කාර්මික ආරාවුල

**පෙනී සිටීම :-**

පළමු පාර්ශ්වය වෙනුවෙන් - නීතීඥ ජානක අධිකාරි මහතා
දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් - නීතීඥ හර්ෂණී සුධාරිකා මහත්මිය ද
ආයතනය නියෝජනය කරමින් කළමනාකරණ නිලධාරී පී. ආර්. ඩබ්ලිව්. ඇලපාත මහතා

<u>බලතල පැවරීම</u>

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන ) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිසංශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරුවකු වශයෙන් මා පත් කර මා වෙත යොමු කර ඇත.

<u>ප්‍රදානය</u>

<u>එකී කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ</u>

"එයාපෝට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) ලිමිටඩ් හි සේවය කළ ජ්‍යෙෂ්ඨ ගිණුම් සහකාර ඩබ්. ඒ. ඒ. ඩී. පුෂ්පකුමාර මහතාව සහකාර ගණකාධිකාරී තනතුරට උසස් නොකිරීමෙන් ඔහුට අසාධාරනයක් සිදු වී තිබේ ද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමි විය යුතු සහන කවරේ ද? යන්න පිළිබඳව වේ.

<u>ආරාවුලට අදාළ පසුබිම</u>

මෙම ආරාවුලට අදාල පළමු පාර්ශ්වය වන ඩබ්. ඒ. ඒ. ඩී. පුෂ්පකුමාර යන අය 1985.07.02 වන දින ලිපිකරු II ශ්‍රේණියට එයාර්පෝට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) ලිමිටඩ් ආයතනයේ සේවයට බැඳී ඇත. ඉන් පසුව 1989.01.25 වැනි දින පොත්තබන්නා I ශ්‍රේණියට ආයතනය විසින් මෙම ආරාවුලට අදාළ පළමු පාර්ශ්වයට උසස්වීමක් ලබා දී ඇත. ඉන් අනතුරුව 1999.01.01 වැනි දින සිට පොත් තබන්නා විශේෂ ශ්‍රේණිය I තනතුරට ද, 2000.01.01 දින සිට ජ්‍යෙෂ්ඨ ගිණුම් සහකාර III ශ්‍රේණිය තනතුරට ද, 2003.01.01 දින සිට ජ්‍යෙෂ්ඨ ගිණුම් සහකාර II ශ්‍රේණිය තනතුරට ද, 2006.01.01 දින සිට විශ්‍රාම ගන්නා ලද දිනය වන 2017 වසර දක්වා ජ්‍යෙෂ්ඨ ගිණුම් සහකාර I ශ්‍රේණිය තනතුරේ සේවය කර ඇත.

මෙම ආරාවුලට අදාල පළමු පාර්ශ්වය වන ඩබ්. ඒ. ඒ. ඩී. පුෂ්පකුමාර යන අය විශ්‍රාම ගැනීමට පෙර ජ්‍යෙෂ්ඨ ගිණුම් සහකාර තනතුරේ සේවය කරමින් සිටින අතරතුර අභ්‍යන්තර උසස්වීමක් වන ගිණුම් සහකාර තනතුර සඳහා 1999 වර්ෂයේ දී ඉල්ලු කළ ද, එම උසස්වීම දෙවන පාර්ශ්වීය ආයතනය විසින් ලබා නොදීම මත පළමු පාර්ශ්වයට සහකාර ගණකාධිකාරී තනතුර ලබාගැනීමට නොහැකි වූ බවත් ඉල්ලුම් කළ සෑම උසස්වීමක්ම ලබා දීමේදී තමාට වෙනස් කොට සලකා ඇතැයි යන පදනම මත මෙම ආරවුල බේරුම්කරණය මගින් විසඳීම සඳහා යොමු කර ඇත.

<u>සාක්ෂි විශ්ලේෂණය</u>

මෙම ආරාවුල් පළමු පාර්ශ්වය දෙවන පාර්ශවයේ ආයතනයට 1985.07.02 වන දින ලිපිකරු II ශ්‍රේණියට සේවයට බැඳී ඇති බව දෙවන පාර්ශ්වීය ආයතනය වෙනුවෙන් සාක්ෂි ලබාදුන් ආයතනයේ මානව සම්පත් කළමනාකරු වන කීර්ති වික්‍රමසිංහ ජයසේකර යන අය විසින් බේරුම්කරණ විනිශ්චය සභාවට සලකුණු කර ඉදිරිපත් කරන ලද R3 දරන ලේඛණය මගින් ද, පළමු පාර්ශ්වය මගින් බේරුම්කරණ විනිශ්චය සභාවට ඉදිරිපත් කරන ලද A1 දරන ලේඛනය මගින් ද තහවුරු වේ. 1986.10.06 වන දින මෙම ආරාවුලට අදාළ පළමු පාර්ශ්වය උක්ත තනතුරේ දෙවන පාර්ශ්වීය ආයතනය විසින් ස්ථිර කර ඇත. ඒ බව දෙවන පාර්ශ්වීය ආයතනය වෙනුවෙන් බේරුම්කරණ විනිශ්චය සභාවේදී සාක්ෂි ලබා දුන් මානව සම්පත් නිලධාරීතුමා මගින් සළකුණු කර ඉදිරිපත් කරන ලද R4 ලේඛණය මගින් තහවුරු වේ.

ඉන් අනතුරුව මෙම ආරාවුලට ආදාළ පළමු පාර්ශ්වය 1988.07.26 වන දින කොස්ට් ක්ලාක් I ශ්‍රේණිය තනතුර සඳහා ඉල්ලුම් පත්‍රයක් යොමු කර ඇති බව දෙවන පාර්ශ්වීය ආයතනය වෙනුවෙන් සාක්ෂි ලබාදුන් ආයතනයේ මානව සම්පත් නිලධාරී මගින් සලකුණු කර බේරුම්කරණ විනිශ්චය සභාවට ඉදිරිපත් කරන ලද R5 ලේඛණය මගින් ද, එම තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් මෙම ආරාවුලේ පළමු පාර්ශ්වයට නොමැති වීම මත එම ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප වී ඇති බව R6 ලේඛණය මගින් ද, තහවුරුවේ.

1988.09.28 වැනි දින ආයතනය මගින් පළකරන ලද දැන්වීමක් මත පොත් තබන්නා I ශ්‍රේණිය තනතුර සඳහා මෙම ආරාවුලට අදාළ පළමු පාර්ශ්වය ඉල්ලුම්කර අදාළ සුදුසුකම් සපුරා තිබීම මත සම්මුඛ පරීක්ෂණයෙන් සමත්වීම මත දෙවන පාර්ශ්වීය ආයතනය මගින් පළමු පාර්ශ්වය පොත් තබන්නා I ශ්‍රේණිය තනතුර සඳහා පත්කර ඇති බව දෙවන පාර්ශ්වීය ආයතනය වෙනුවෙන් සාක්ෂි ලබාදුන් ආයතනයේ මානව සම්පත් නිලධාරී මගින් සලකුණු කර බේරුම්කරණ විනිශ්චය සභාවට ඉදිරිපත් කරන ලද R7, R7, (A) ලේඛනය මගින්ද පළමු පාර්ශ්වය වන ඩබ් ඒ. ඒ. ඩී. පුෂ්පකුමාර යන අය විසින් මෙම බේරුම්කරණ විනිශ්චය සභාවේ සාක්ෂි ලබාදෙමින් සලකුණු කර ඉදිරිපත් කරන ලද A2 දරන ලේඛනය මගින් ද තහවුරු වේ.

නැවත වරක් 1995.12.20 වැනි දින දරන ලිපිය මගින් පොත් තබන්නා විශේෂ II ශ්‍රේණිය තනතුර සඳහා උසස් වීමක් ලබා දී ඇති බව දෙවන පාර්ශ්වීය ආයතනය වෙනුවෙන් සාක්ෂි ලබාදුන් ආයතනයේ මානව සම්පත් නිලධාරී මගින් සලකුණු කර බේරුම්කරණ විනිශ්චය සභාවට ඉදිරිපත් කරන ලද R8 දරන ලේඛනය මගින් තහවුරු වේ. පසුව 1999.10.25 වන දින මෙම ආරාවුලට අදාළ පළමු පාර්ශ්වයට පොත් තබන්නා විශේෂ I ශ්‍රේණිය තනතුරට උසස් වීමක් ලබා දී ඇති බව දෙවන පාර්ශ්වීය ආයතනය වෙනුවෙන් සාක්ෂි ලබාදුන් ආයතනයේ මානව සම්පත් නිලධාරී මගින් සලකුණු කර බේරුම්කරණ විනිශ්චය සභාවට ඉදිරිපත් කරන ලද R9 දරන ලේඛනය මගින් වැඩිදුරටත් තහවුරු වේ.

ඉන් අනතුරුව ආයතනයේ පරිපාලනමය තීරණයක් මත පොත් තබන්නා තනතුර ජ්‍යෙෂ්ඨ ගිණුම් සහකාර යන තනතුර ලෙස තනතුරු නාමය වෙනස් කරන ලද බව මෙම ආරාවුලේ පළමු පාර්ශ්වය වන ඩබ්. ඒ. ඒ. ඩී. පුෂ්පකුමාර යන අය වෙත 2004.02.20 වැනි දින දරන ලිපිය මගින් දැනුම් දී ඇති බව මෙම ආරාවුලේ දෙවන පාර්ශ්වීය ආයතනය වෙනුවෙන් සාක්ෂි ලබාදුන් ආයතනයේ මානව සම්පත් නිලධාරී මගින් සලකුණු කර බේරුම්කරණ විනිශ්චය සභාවට ඉදිරිපත් කරන ලද R10 දරන ලේඛනය මගින් ද පළමු පාර්ශ්වය වන ඩබ්. ඒ. ඒ. ඩී. පුෂ්පකුමාර යන අය විසින් මෙම බේරුම්කරණ විනිශ්චය සභාවේ සාක්ෂි ලබාදෙමින් සලකුණු කර ඉදිරිපත් කරන ලද A3 දරන ලේඛනය මගින්ද සනාථ වේ.මෙම තනතුරු නාමය වෙනස් කිරීම සම්බන්ධයෙන් මෙම ආරාවුලේ පළමු පාර්ශ්වයේ කිසිදු විරෝධතාවයක් නොමැති බවට 2003.11.03 වැනි දින දරන ලිපිය මගින් ආයතනයට ලබා දී ඇති බව දෙවන පාර්ශ්වීය ආයතනය වෙනුවෙන් සාක්ෂි ලබාදුන් මානව සම්පත් නිලධාරීවරයා මගින් සලකුණු කර බේරුම්කරණ විනිශ්චය සභාවට ඉදිරිපත් කරන ලද R11 දරන ලේඛනයෙන් තහවුරු වේ.

මෙම ආරාවුල විභාග වන අවස්ථාවේ පළමු පාර්ශ්වය විසින් සාක්ෂි ලබා දී ඇත්තේ 1993-2003 දක්වා කාල සීමාව තුළ ව්‍යාපෘති අංශයේ සහකාර ගණකාධිකාරී ලෙස වැඩ ආවරණ කළ බවකි. නමුත් ඒ සම්බන්ධයක් කිසිදු ලිඛිත සාක්ෂියක් හෝ වෙනත් වාචික සාක්ෂියක් මගින් බේරුම්කරණ විනිශ්චය සභාවට එම රාජකාරී ආවරණය කිරීම සම්බන්ධයෙන් තහවුරු කරගත හැකි සාක්ෂියක් ඉදිරිපත් කර නොමැති අතර ඩබ්. ඒ. ඒ. ඩී. පුෂ්පකුමාර යන අයගේ පෞද්ගලික ලිපි ගොනුව පරීක්ෂා කිරීමේ දී පවා එවැනි ලේඛනයක් නොමැති බව දෙවන පාර්ශ්වීය ආයතනය වෙනුවෙන් සාක්ෂි ලබාදුන් මානව සම්පත් නිලධාරීවරයා සාක්ෂි ලබාදෙන අවස්ථාවේ ප්‍රකාශ කර ඇත.

1999 මැයි මස 10 වන දින නැවත වරක් ගිණුම් සහකාර තනතුර සඳහා ආයතනයේ අභ්‍යන්තර දැන්වීමක් මගින් කැඳවීමක් කර ඇති අතර, එම තනතුර සඳහා මෙම ආරාවුලේ පළමු පාර්ශ්වය ඉල්ලුම්කර ඇති බව R14 ලේඛනයෙන් සනාථ වන අතර එම තනතුර සඳහා ඉල්ලුම්කරන ලද නව ඉල්ලුම්කරුවකු වන අරුණ වික්‍රමසූරිය යන අය මෙම ආරාවුලේ පළමු පාර්ශ්වයට වඩා ඉහළ අධ්‍යාපන සුදුසුකම් තිබීම මත හා වසර 4ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම මත එම අවස්ථාවේ උක්ත තනතුර සඳහා අරුණ වික්‍රමසූරිය පත්ව ඇති අතර ඩබ්. ඒ. ඒ. ඩී. පුෂ්පකුමාර යන අයට මෙම තනතුර සඳහා ඉල්ලුම් කිරීමට ප්‍රමාණවත් සුදුසුකම් තිබුණ ද, අනෙක් ඉල්ලුම්කරු මෙම ආරාවුලේ පළමු පාර්ශ්වයට වඩා ඉහළ අධ්‍යාපන සුදුසුකම් සමග අනෙකුත් සුදුසුකම් ද, සපුරා තිබීම මත අරුණ වික්‍රමසූරිය යන අයට ගිණුම් සහකාර තනතුර ලැබී ඇත. එහි කිසිදු ආකාරයක වෙනස් කොට සැලකීමක් දක්නට නොලැබේ. ඒ බව විගණන වාර්තාවෙන්ද පිළිගෙන ඇත.

1999 වසරේදී 1356/1999 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මත මේ වන විට බේරුම්කරණ විනිශ්චය සභාවේ දී සලකුණු කර ඉදිරිපත් කර ඇති R2 ලේඛනය මගින් දක්වා ඇත්තේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත සියලුම ගිණුම් සහකාරවරයන්, සහකාර ගණකාධිකාරී තනතුරට උසස් කිරීමට තීරණය කිරීම මත එවකට ගිණුම් අංශයේ සේවය කළ සියලුම ගිණුම් සහකාරවරුන්, සහකාර ගණකාධිකාරී තනතුරට උසස් කර ඇත. තවද, එම සහකාර ගණකාධිකාරී තනතුරට ඉදිරියේදී බඳවා ගැනීමේ දී නිසි සුදුසුකම් මත බඳවා ගැනීමට ද තීරණය කර ඇත. ඒ සම්බන්ධයෙන් 1356/1999 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව වන R2 ලේඛනය වඩා වැදගත් සාක්ෂිමය ලේඛනයක් වන අතර ආයතනය වෙනුවෙන් සාක්ෂි ලබාදුන් ආයතනයේ මානව සම්පත් නිලධාරීවරයාගේ සාක්ෂියෙන් ද, එය තවදුරටත් තහවුරුවේ.

නමුත් මෙම අවස්ථාව වන විට මෙම ආරාවුලට අදාළ පළමු පාර්ශ්වය විසින් දරන ලද තනතුර වූයේ පොත් තබන්නා විශේෂ ශ්‍රේණිය I වූ අතර එබැවින් ඩබ්. ඒ. ඒ. ඩී. පුෂ්පකුමාර යන අයට සහකාර ගණකාධිකාරී තනතුර එම අවස්ථාවේ ලැබී නොමැත. මක්නිසාද යත් එම අවස්ථාවේ සහකාර ගණකාධිකාරී තනතුරට උසස්වීම් ලබා දී ඇත්තේ එම අවස්ථාව වන විට ගිණුම් සහකාර තනතුරේ සේවය කළ සේවකයන්ට පමණක් වන බැවිනි.

පසුව ආයතනය විසින් 2001.05.16 වන දින අභ්‍යන්තර දැන්වීමක් වන සේවක මණ්ඩල සහකාර තනතුර (මාණ්ඩලික සහකාර) සඳහා අයදුම්පත් කැඳවා ඇති බව R16 ලේඛන අනුව සනාථ වන අතර එම අවස්ථාවේ මෙම ආරාවුලේ පළමු පාර්ශ්වය වන

ඩබ්. ඒ. ඒ. ඩී. පුෂ්පකුමාර යන අයට එම තනතුරට අයදුම් කිරීමට ප්‍රමාණවත් සුදුසුකම් තිබීම මත, එම තනතුර සඳහා අයදුම්කර ඇති අතර ඒ අනුව මෙම ආරාවුලේ පළමු පාර්ශ්වය සම්මුඛ පරීක්ෂණයට කැඳවා ඇති අතර නමුත් ඩබ්. ඒ. ඒ. ඩී. පුෂ්පකුමාරට වඩා ඉහළ අධ්‍යාපන සුදුසුකම් සහිත සේවකයකු වන කේ. ඒ. එස්. පී. පෙරේරා ඒ සඳහා තෝරා ගෙන ඇත.මෙම සම්මුඛ පරීක්ෂණය මෙම සේවකයින් දෙදෙනා පමණක් සහභාගී වූ සම්මුඛ පරීක්ෂණයක් නොවන බව R1 දරන ලේඛනය සාක්ෂි දරන අතර එම සේවකයින් අතරින් වැඩිම ලකුණු ලබාගත් කේ. ඒ. එස්. පී. පෙරේරා යන අය මාණ්ඩලික සහකාර *හෙවත්* සේවක මණ්ඩල සහකාර තනතුර සඳහා තේරී පත් වී ඇති අතර විගණන වාර්තාව අනුව මෙම ලකුණු ලබා දීමේදී යම් මුද්‍රණ දෝෂයක් සිදු වී ඇති බව පෙන්වා දී ඇති නමුත් මෙම අයදුම්කරුවන් දෙදෙනාගේ ලකුණු පරතරය ලකුණු 34 ක් වන අතර මුද්‍රණ දෝෂය අනුව එහි සටහන් වී නැති හිඟ ලකුණු ප්‍රමාණය වන්නේ ලකුණු 5 ක් පමණ වන අතර එය නිවැරදි කළ ද, ඩබ්. ඒ. ඒ. ඩී. පුෂ්පකුමාරට කේ. ඒ. එස්. පී. පෙරේරා ගේ ලකුණු මට්ටමට ළඟා විය නොහැකි බව ලකුණු සටහන් ලේඛනය වන R1 අනුව තහවුරු වේ.

2003 වසරේ දී උක්ත තනතුර සඳහා අයදුම්පත් කැඳවා ඇති බව R28 දරන ලේඛනය සාක්ෂි දරන අතර 2005 වසරේ දී ද, උක්ත තනතුර සඳහා අයදුම්පත් කැඳවා ඇති බව R29 දරන ලේඛනය අනුව තහවුරු වන අතර ඒ සඳහා ඩබ්. ඒ. ඒ. ඩී. පුෂ්පකුමාර මහතා සමග තවත් ඉල්ලුම්කරුවන් කිහිපදෙනෙකු ද මෙම තනතුර සඳහා ඉල්ලුම් කර ඇති බව R28(a), R(29(a) සහ R28(b) දරන ලේඛනය අනුව තහවුරු වේ. නමුත් අදාළ සුදුසුකම් මත ඩබ්. ඒ. ඒ. ඩී. පුෂ්පකුමාරට වඩා ඉහළ ලකුණු ලබා ගනිමින් උක්ත වසර දෙකේදීම පිළිවෙලින් ඩබ්ලිව්. එච්. එස්. ධර්මප්‍රිය මහතා, මහගමසේකර මහත්මිය සහ පී. ඩී .ටී. කේ. පෙරේරා යන අය උක්ත තනතුර සඳහා තේරී පත් වී ඇති බව ලේඛනමය සාක්ෂි මගින් හා මෙම ආරාවුල විභාග වන අවස්ථාවේ දී ඉදිරිපත් වූ වාචිකමය සාක්ෂි මගින් තහවුරු වේ.

2005.04.04 වැනි දින සහකාර ගණකාධිකාරී තනතුර සඳහා ඉල්ලුම්පත් කැඳවා ඇති අතර එහිදී සේවක මණ්ඩල සහකාර (ගිණුම්) තනතුරේ ඩබ්. ඒ. ඒ. ඩී. පුෂ්පකුමාර යන අය සේවය කර නොතිබූ බැවින් මෙම තනතුර සඳහා අයදුම් කිරීමට ඩබ්. ඒ. ඒ. ඩී. පුෂ්පකුමාර වන මෙම ආරාවුලේ පළමු පාර්ශ්වයට හැකියාවක් ලැබී නැති බව දෙපාර්ශ්වයෙන් ම ඉදිරිපත් වී ඇති ලේඛනමය සාක්ෂි මගින් හා වාචිකමය සාක්ෂි මෙගින් තහවුරු වේ.

තව ද, විගණන වාර්තාව සකස් කිරීමේ දී ඇති වූ අපැහැදිලිතා විසඳා ගැනීමට කිසිදු වාචිකමය සාක්ෂියක් මෙහි පළමු පාර්ශ්වයෙන් හැරෙන්නට කැඳවා නැත. කිසිදු අවස්ථාවක සහකාර ගණකාධිකාරී තනතුර සඳහා එකම සුදුස්සා මෙම ආරාවුලේ පළමු පාර්ශ්වය බවට නිගමනයක් ලබා දී නොමැති අතර ඒ බව විගණන වාර්තාව සම්බන්ධයෙන් සාක්ෂි ලබා දීම කර ඇති ආයතනයේ අභ්‍යන්තර විගණකවරයාගේ සාක්ෂියෙන් ද ප්‍රකාශ වන අතර එම වාර්තාවේ අවසාන වශයෙන් ලබා දී ඇති නිර්දේශය වන්නේ මෙම ආරාවුලේ පළමු පාර්ශ්වය වන ඩබ්. ඒ. ඒ. ඩී. පුෂ්පකුමාර යන අය විශ්‍රාම යාමට නියමිත බැවින් එය සලකා බලා සහකාර ගණකාධිකාරී ධුරය ලබාදෙන ලෙසය. පසුව ආයතනය විසින් සේවක මණ්ඩල සහකාර (ගිණුම්) තනතුර ලබාදීමට එකඟ වුවද, එම තනතුර බාර ගැනීමට ඩබ්. ඒ. ඒ. ඩී. පුෂ්පකුමාර යන අය කැමැත්ත පළකර නොමැති බව මෙම ආරාවුල විභාග වන අවස්ථාවේ ඉදිරිපත් වී ඇති ලේඛනමය හා වාචිකමය සාක්ෂි මගින් තහවුරු වේ.

ආයතනයකට ඵලදායි සේවාවක් ලබාගැනීමට ආයතනයක් විසින් උපරිම සුදුසුකම් මත සේවකයන් අදාළ තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කරයි. එම තනතුරුවලට අදාළ සුදුසුකම් කාලෝචිතව වෙනස්කම්වලට භාජනය වේ. එය කිසිදු විටෙක එක් අයෙක් අරමුණු කරගෙන පළිගැනීමේ චේතනාවෙන් වෙනස්කම්වලට භාජනය නොකරයි. මෙම ආරාවුලේ ඩබ්. ඒ. ඒ. ඩී. පුෂ්පකුමාර යන අයට උසස්වීම් ලබා දීමේදී කිසිදු අවස්ථාවක එවැනි වෙනස් කොට සැලකීමකට භාජනය කර ඇති බව ඉදිරිපත් වී ඇති ලේඛනමය හා වාචිකමය සාක්ෂි මගින් සනාථ නොවන අතර අදාළ තනතුරු සඳහා අදාල සුදුසුකම් වෙනස් කිරීමකට භාජනය කර ඇත්තේ එය හුදෙක්ම ආයතනයේ ඵලදායිතාව හා කාර්යක්ෂමතාව වැඩි කර ගැනීම සඳහා ක්‍රියාමාර්ගයක් ලෙස බව තහවුරු වේ.

එබැවින් ජ්‍යෙෂ්ඨ ගිණුම් සහකාර ඩබ්. ඒ. ඒ. ඩී. පුෂ්පකුමාර යන අයට සහකාර ගණකාධිකාරී ධුරයට උසස් නොකිරීමෙන් අසාධාරණයක් සිදු වී ඇති බව මෙම ආරාවුල විභාග වන අවස්ථාවේ ඉදිරිපත් වී ඇති ලේඛනමය හෝ වාචිකමය සාක්ෂි මගින් තහවුරු නොකරයි. එබැවින් ඉල්ලා ඇති සහන කිසිවක් ලබාදීම සම්බන්ධයෙන් කිසිදු ප්‍රදානයක් ලබා දීමට කටයුතු නොකරමි. මෙය යුක්තිසහගත හා සාධාරණ තීරණයක් බවට නිගමනය කරමි.

නීතීඥ කේ. කුමුදු කුමාරි ධනපාල,
(බේරුම්කරු).

2023 අප්‍රේල් මස 28 වැනි දින.

EOG 06 - 0024

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.